**www.wsws.org** ලෝක සමාජවාදී වෙබ් අඩවිය
හතර වන ජාත්‍යන්තරයේ ජාත්‍යන්තර කමිටුවේ ප්‍රකාශනය

# පලස්තීන ජනයා සහ නොනවතින විප්ලවයේ ඉදිරි දර්ශනය

## The Palestinians and the perspective of Permanent Revolution

**ක්‍රිස් මාස්ඩන් විසිනි.**

**2009 නොවැම්බර් 26**

පලස්තීන මහජනයා අතරින් වියැකී යන තම අධිකාරිය සහතික කර ගැනීමට මොහොමඩ් අබ්බාස් හා ෆාටා නායකත්වයන් දරන්නා වූ අනවරත පරිශ්‍රමයන් මගින් විදහා දක්වන්නේ ඊස්රායලය සහ එහි අනුග්‍රාහකයා වන ඇමරිකා එක්සත් ජනපදය සමග ගිවිසුමකින් පලස්තීන රාජ්‍යයක් ස්ථාපිත කර ගැනීම පිලිබඳ ෆාටා සංවිධානයේ වැඩපිලිවෙලේ කාලකන්නි බංකොලොත්භාවය ම පමනකි.

ඔහුගේ ප්‍රකාශක පලස්තීන අධිකාරියේ බිඳ වැටීම පිලිබඳ අනතුරු අඟවා ඇති නමුදු දැනටමත් තම ධුර කාලය ඉක්මවා ගොස් සිටින අබ්බාස් ජනවාරි 24 දිනට යෙදී ඇති මැතිවරනයට ඉදිරිපත් නොවන බව නිවේදනය කර ඇත. මැද පෙරදිග වූ ඊනියා සාම සැලස්මේ කොටසක් වන සාමූහික පදිංචි කිරීම් අත්හිටුවීමක් සඳහා කල ඉල්ලීම් ප්‍රසිද්ධියේ ඉවත දැමූ එක්සත් ජනපද රාජ්‍ය ලේකම් හිලරි ක්ලින්ටන්ගේ අවමන්වලට බඳුන් වීමෙන් අනතුරුව අබ්බාස් එසේ තීන්දු කලේය. ඔවුන්ගේ ඉදිකිරීම් සීමා කිරීමට පොරොන්දු වීමෙන් "බලාපොරොත්තු නොවූ" සහන පිරිනැමීම පිලිබඳව ද ක්ලින්ටන් සිය ප්‍රසාදය ඊස්රායලය වෙත පල කලාය.

නැගෙනහිර ජෙරුසලම, අනාගත පලස්තීන රාජ්‍යයක අගනුවර වනු ඇතයි නිවේදනය කිරීම එක්සත් ජනපදය විසින් ප්‍රකාශයට පත් කිරීම ද නිලධාරීන්ට අවශ්‍ය බව ප්‍රකාශ කිරීමත් සමග සාමූහික පදිංචි කිරීම් නැවැත්වීමකින් තොරව තවදුරටත් සාකච්ඡා නොතිබෙනු ඇතයි අබ්බාස් සඳහන් කලේය. ඔබාමා පාලන තන්ත්‍රයෙන්, විශේෂයෙන් ම ගාසා තීරය පාලනය කරන්නා වූ හමාස්වරුන්ට එම මැතිවරන අල්ලා ගැනීමට ඉඩ නොදීමට වොෂිංටනය ගනන් බලා තිබීම හේතුවෙන්, මෙයට තදබල ප්‍රතිචාරයක් පැමිනියේ ය. සියලු මැතිවරන අවලංගු කිරීමට අබ්බාස්ගේ අභිප්‍රාය පිලිබඳව සහතික කර ගත් දින පටන් එම ප්‍රතිචාර ලැබෙමින් පවතී.

ෆාටාවේ ඊලඟ පියවර වූයේ ස්වාධීනත්වය පිලිබඳ ඒක පාර්ශවීය ප්‍රකාශනයක් වෙනුවෙන් අරාබි පාලන තන්ත්‍රයන්ගෙන් සහයෝගය ලබා ගැනීමට එය උත්සාහ කරමින් සිටින බව ද එක්සත් ජාතීන්ගේ ආරක්ෂක මන්ඩලය මගින් අනුමත කරවා ගැනීම ඉල්ලා සිටීමත් නිවේදනය කිරීම ය. විවිධාකාර අරාබි ආඥාදායකයන් වෙතින් එවැනි සහයෝගයක් ලැබුනේ නැත. යුරෝපා සංගමය කල අයුරින් ම එක්සත් ජනපදය ද එසේ පිලිගැනීම ක්ෂනිකව ම ප්‍රතික්ෂේප කලේ ය.

අවසානයේ දී අබ්බාස් බීබීසීය වෙත ප්‍රකාශ කලේ ජ්‍යෙෂ්ඨ ෆාටා සාමාජිකයන් විසින් "තුන්වැනි ඉන්ටිෆාඩාවකට" කල කැඳවුමට ඔහු සහයෝගය දුන් බවය. එහෙත් මෙහි තේරුම වන්නේ ජනාවාස ඉදිකිරීමට එරෙහිව විරෝධතා ව්‍යාපාර උත්සන්න කිරීම පමනක් බවත් ෆාටා සංවිධානය ඊස්රායලයට එරෙහිව සන්නද්ධ අරගලයක් අනුමත නොකරන බවටත් ඔහු පැහදිලි කලේය. "යථාර්ථවාදී නොවන මිලිටරිමය විකල්පය තිබේ. මා මිලිටරි විසඳුමක් පිලිබඳව කතා කරන විට මා එයින් අදහස් කරන්නේ ඊස්රායලයට එරෙහි යුද්ධයක් අරාබි රටවල් විසින් ආරම්භ කිරීම වන අතර අරාබි රටවල් එවැනි පූර්වාදර්ශයකට සූදානම් නැත. සන්නද්ධ අරගලයක් පවතී, එහෙත් මා එයට එරෙහි වන්නේ ගාසා තීරයේ පසුගිය යුද්ධයේ දී සනාථ වූ අයුරින් එවැන්නක් මගින් පලස්තීන ජනයා විනාශය සහ ව්‍යසනය වෙත ඇද දැමීම පමනක් සිදු වනු ඇති හෙයිනි."

ෆාටා නායකත්වය යටතේ පලස්තීන ජනයා සැබවින්ම ඛේදනීය විපාකයන්ගෙන් යුතු අවෘත අන්තයක් වෙත ඇදගෙන ගොස් තිබේ. මිලියන තුන් කාර්තුවක පලස්තීනුවන් ඊස්රායල හමුදාව විසින් ඔවුන්ගේ නිවාස වලින් නෙරපා පිටුවහලට යවනු ලැබූ නක්බා සිදුවීමෙන් පසු 61 වසරකි. ප්‍රජාතාන්ත්‍රික සහ අනාගමික පලස්තීන රාජ්‍යයක් වෙනුවෙන් දශක ගනනාවක අරගලයක් දියත් කරනු ලැබූ සංවිධානය ෆාටාව බවට පරිවර්තනය වී වසර 55 කි. ඊස්රායලයට

පසෙකින් ස්වාධීන පලස්තීන රාජ්‍යයක් ස්ථාපිත කිරීමේ දිසාවට දිවෙන පස් වසරක අන්තර් පාලනයක කොටසක් යැයි කියනු ලැබූ පලස්තීන අධිකාරිය (පීඒ) ප්‍රතිෂ්ඨාපනය කරමින් 1993 දී අරෆාත් සහ අබ්බාස් විසින් අත්සන් කරන ලද ඔස්ලෝ ගිවිසුමෙන් "ද්වි-රාජ්‍ය" විසඳුමකට පක්ෂව මෙම ඉදිරි දර්ශනය අත්හැර දැමූ තැන් සිට වසර දහසයක් ගතව තිබේ.

අද දක්වාමත්, පලස්තීන ජනයා ඊස්රායලය විසින් වට ලනු ලැබූ මිලිටරි කෘත ජනාවාස දෙකකට කොටු කරනු ලැබ සිටිති. අනවරත ලේවැකි ආක්‍රමනයන්ට යටත් කරනු ලැබ සතුරු ආරක්ෂක සේවාවන් විසින් රැකවල් ලා සිටිති. ටෙල් අවිව් විසින් කම්කරුවන් සහ ගොවියන්හට රැකියා, වෛද්‍ය ප්‍රතිකාර හොඳ ආහාර සහ බීමට ජලය පවා නොදෙන නමුදු අතිශයින්ම ධනයෙන් ආඪ්‍ය වූ දූෂිත ධනේශ්වර තට්ටුවක් විසින් යටත් කර තබා ගෙන සිටිති. සාම ක්‍රියාදාමය, ඊස්රායලය විසින් පලස්තීන අධිකාරිය මහා මාර්ග පද්ධතියකින්, ආරක්ෂක මුරකපොලු සහ කුප්‍රකට "ආරක්ෂක තාප්පය" මගින් අසංඛ්‍ය කැබලිතිවලට බෙදා වෙන් කිරීමටත් ජනාවාසකරනය පලල් කරමින්, බටහිර ඉවුරේ ( වෙස්ට් බැන්ක් ) ඉමහත් ප්‍රදේශයක් ද සමගින් නැගෙනහිර ජෙරුසලමේ තම පාලනය තහවුරු කරගැනීමටත් යොදා ගන්නා කඩතුරාවක් විනා අන් කවරක් වත් නොවේ.

ඔස්ලෝ ගිවිසුම යටතේ ආරම්භකත්වය ගත් වොෂිංටනය සමග සන්ධානයක් ඔස්සේ රාජ්‍යයක් අටවා ගැනීමට අබ්බාස් පෞද්ගලිකව ම ප්‍රවේශ වූයේ වුවද මෙය හුදෙක් ම අබ්බාස්ගේ අසමර්ථතාවේ ප්‍රතිඵලයක් පමනක් ම නොවේ. ෆාටා සංවිධානය තුල මෙම අසාර්ථක වූ ඉදිරි දර්ශනයට විකල්පයක් ඉදිරිපත් කරන කන්ඩායමක් ඇත්තේ නැත. හමාස් සංවිධානය, හුදෙක් ආගමික රාජ්‍යයක ආක්‍රමනකාරී අනුශාසනාවකට ගැටගැසුනු ඉරානයේ සහ සවුදි අරාබියේ තම අනුග්‍රාහකයන්ගේ මගපෙන්වීම යටතේ විරෝධය පෑමේ වඩාත් රැඩිකල් ආකාරයක් සැලසුම් කරමින් සිටිනවා පමනි.

ලියොන් ට්‍රොට්ස්කි තම නොනවතින විප්ලව න්‍යායේ දී තහවුරු කරනු ලැබුවේ, අධිරාජ්‍යවාදී යුගයේ දී කල් පසුවූ ධනේශ්වර සංවර්ධනයකින් යුතු රටවල්වල ධනපති පන්තිය අධිරාජ්‍යවාදයෙන් සැබෑ ආර්ථික හා දේශපාලනික ස්වාධීනත්වය අත් කර ගැනීමෙහිලා අසමත් බවයි. මෙම ඉදිරි දර්ශනය මැනවින් ඔප්පු කෙරී ඇත.

දූෂිත ධනේශ්වර කල්ලි, පවත්නා ආර්ථික හා සමාජ පර්යායේ ආරක්ෂකයන් ලෙස ක්‍රියාත්මක අතර සමස්ථ මැදපෙරදිග මෙන්ම ජාත්‍යන්තරව කම්කරුවන්ගේ හා ගොවියන්ගේ ජීවන කොන්දේසීන් බාදනය ව ඇත. අරාබි පාලන තන්ත්‍රයන් තමන් දැවන්ත තෙල් සංචිත පාලනය කරද්දී පවා ක්‍රියාත්මක වනු ලබන්නේ අන්තර් ජාතික බැංකු සහ සංගත විසින් අධිකාරිය දරන්නා වූ ලෝක ආර්ථිකයක් තුලය. ඔවුන්ගේ ධනය පදනම් වී ඇත්තේ කම්කරු පන්තිය සූරා කෑම මතය. අධිරාජ්‍යවාදී ලෝක පර්යායට තමන්ගේ හිතපක්ෂපාතීත්වය සහතික කර සිටීමේ ප්‍රමුඛ හේතුව වන්නේ ඔවුන්ගේ පාලනයට කම්කරු පන්තිය තුලින් අභියෝගයක් ඉස් මතු වීම කෙරෙහි ඇති භීතියයි.

මේ හේතුව නිසා ආරාබි රාජ්‍යයෝ පලස්තීන ජනයා පාවාදීමේ නින්දා සහගත භූමිකාවක් යලි යලිත් රඟ දැක්වූහ. අද දින ඔවුහු, ඊජිප්තුව පිලිබඳ සිදු වීමේ දී මෙන් ඊස්රායලය විසින් ක්‍රියාවට දමා ඇති පලස්තීන ජන මර්දනයෙහිලා සෘජු පාප සහායකයා වශයෙන් ක්‍රියාකරමින් සිටී, නැතහොත් මෙම ඓතිහාසික අපරාධය දිගට ම කෙරී ගෙන යද්දී නන් දොඩවමින් සිටිති.

පලස්තීන ධනපති පන්තිය විසින් පාලනය කරන්නා වූ අතිරේක පලස්තීන රාජ්‍ය කැබලිත්තක් මගින් කිසිවක් වෙනස් නොවනු ඇත. සමස්ථ මැදපෙරදිග අරාබි ධනපති පන්තියේ සියලු කන්ඩායම්වලට එරෙහිව කම්කරු පන්තියේ ස්වාධීන ව්‍යාපාරයක් ගොඩ නැගීම එහි බෙදුම්කඩනය වශයෙන් නොගෙන ඊස්රායල පීඩනයෙන් තම විමුක්තිය සදාගැනීමේ සාර්ථක අරගලයක් ගෙන යාමට පලස්තීන ජනයාට පුලුවන් කමක් නැත.

යුදෙව් කම්කරු පන්තිය සමග එකමුතුව තහවුරු කර ගැනීමේ ඒකාබද්ධ පරිශ්‍රමයක් එවැනි අරගලයක නාභිය විය යුතුය. ඊස්රායල් රාජ්‍ය කරනු ලබන අපරාධ සම්බන්ධව සමස්ත යුදෙව් මහජනයා ප්‍රතිගාමී ලෙස අනන්‍ය කිරීම අරාබි මහ ජනතාව විසින් සවිඤ්ඤානිකව ප්‍රතික්ෂේප කල යුතුය.

සියොන්වාදී ව්‍යාපාරය විසින් ඊස්රායලය ප්‍රතිෂ්ඨාපනය කිරීම ස්ථාපිත කරනු ලැබුවේ යුරෝපීය යුදෙව් ජනය අත්විඳි දරුනු සංහාරයට විසඳුමක් වශයෙනි. කලාපයේ තවමත් ඉතිරි වී සිටි මුල් පදිංචිකරුවන් බලහත්කාරයෙන් නෙරපීම සහ දරුනු ලෙස මැඩ පැවැත්වීම හරහා ඊස්රායලය නිර්මානය කිරීම යුක්ති සහගත කිරීමට ෆැසිස්ට්වාදය, ස්ටැලින්වාදයේ සාපරාධයන් සහ අවසන් වසයෙන් හොලෝකෝස්ට් සංත්‍රාසයන් යොදා ගනු ලැබින. සියොන්වාදය තම ආරම්භයේ සිට ම යුදෙව් කම්කරු පන්තියේ දේශපාලන සංවර්ධනයට ප්‍රමුඛතම බාධකය වසයෙන් ක්‍රියා කර තිබේ. එහෙත් එහි ආධිපත්‍ය පෙරලා දැමිය හැකිය.

ඊස්රායලය, අසමානතාවේ, විරැකියාවේ සහ දරිද්‍රතාවේ දැවන්ත සහ වැඩෙන මට්ටම් තුල මුල්බැස ඇති ගැඹුරට දිවෙන සමාජ හා ආර්ථික

ප්‍රතිවිරෝධතාවන් මගින් විනාශභාග් වී තිබේ. මෙය කම්කරු පන්තිය, වෛෂයිකව පාලක ප්‍රභුව සහ එහි මිලිටරි යාන්ත්‍රනය සමග ගැටුමකට තල්ලු කරනු ලබයි. තමන්ගේ පැවැත්ම සුරක්ෂිත කර ගැනීම සඳහා ඊස්රායල ධනපති පන්තිය පලස්තීන ජනයා දරුනු ලෙස මර්දනය කලයුතුවා පමනක් නොව රට තුල ප්‍රජාතාන්ත්‍රික අයිතීන් මෙන්ම සමාජ කොන්දේසින් මත පෙර නුවූ විරූ ම්ලේච්ඡ ප්‍රහාරයන් ද එල්ල කල යුතු ය.

ඊස්රායල රාජ්‍යයට පමනක් නොව කලාපයේ සියලුම ධනේශ්වර බලයන්ට එරෙහිව අරාබි සහ යුදෙව් කම්කරුවන්ගේ පොදු අවශ්‍යතාවන්ගේ පදනම මත බලගතු දේශපාලන සන්ධානයක් ගොඩ නැගීමට පුලුවන.

පලස්තීන මහජනයාගේ ඉරනම ඉඳුරා ම සමස්ත කලාපයේ ම වැඩ කරන ජනයාගේ ඉරනම සමග බැඳී පවතී. අධිරාජ්‍යවාදය විසින් පාලනය පවත්වා ගෙන යනු ලබන පවතින ධනේශ්වර ජාතික රාජ්‍යයේ සීමාව ඇතුලත එය විසඳීමේ හැකියාවක් ඇත්තේ නැත. මැද පෙරදිග සමාජවාදී සමූහාන්ඩුවක් ස්ථාපිත කිරීම සඳහා තමන් පිටුපස ග්‍රාමීය දිලිඳු ජනයා පෙලගස්වා ගනු ලැබූ අරාබි සහ යුදෙව් කම්කරු පන්තියේ එකමුතු වීම ඉල්ලා සිටී. මෙයට ම පමනක් කලාපයේ සහ සමස්ත ලෝකයේ මහජනතාවගේ ශුභ සිද්ධිය වෙනුවෙන් කලාපයේ දැවන්ත සම්පත්වල තාර්කික වර්ධනයට පදනම සැකසිය හැකිවනු ඇත.

ක්‍රිස් මාස්ඩන්

© www.wsws.org